| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| දෙවන වාර පරීක්ෂණය - 2018 | | |
| පුරවැසි අධ්‍යාපනය | 10 ශ්‍රේණිය | කාලය පැය එකකි |

නම: ..............................................................

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාන්න.
- සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

1) ඍජුව හෝ වක්‍රව පාලන කටයුතු සඳහා ජනතාව සහභාගීවීමට ඉඩ ලැබෙන පාලන ක්‍රමය වන්නේ,

i. රාජාණ්ඩු පාලන ක්‍රමය ii. සමාජවාදී පාලන ක්‍රමය

iii. ප්‍රජාත්‍රන්ත්‍රවාදී පාලන ක්‍රමය. iv. කොමියුනිස් පාලන ක්‍රමය.

2) ප්‍රජාත්‍රන්ත්‍රවාදී යනු සියළු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයකි.'' මෙම නිර්වචනය ඉදිරිපත් කරනු ලැබුවේ.

i. V.I. ලෙනින් ii. ඒබ්‍රහම් ලින්කන්

iii. සීලර් iv. D.G. කෝල්

3) ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වන්නේ,

i. මහ සභාවයි. ii. පුරවැසි සභාවයි.

iii. ප්‍රජා සභාවයි. iv. මහ විනිශ්චය සභාවයි.

4) ඒක පක්ෂ ක්‍රමයක් පවතින රටවල් දෙකක් සහිත පිළිතුර තෝරන්න.

i. කියුබාව, ඇමෙරිකාව ii. ඉන්දියාව, උතුරු කොරියාව

iii. චීනය, උතුරු කොරියාව iv. ඇමෙරිකාව, චීනය

5) ශ්‍රී ලංකා මැතිවරණ දිස්ත්‍රික්ක සිතියමේ අංක 22 වන දිස්ත්‍රික්කය වන්නේ,

i. කෑගල්ල ii. ගාල්ල

iii. මොණරාගල iv. රත්නපුරය

6) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා බලනු ලබන ප්‍රධාන නිර්නායකය වන්නේ,

i. භූමිය හා ජාතිය ii. භූමිය හා ජනගහනය

iii. භූමිය හා දිශාව iv. භූමිය හා ජනාවාස

7) ව්‍යවස්ථා දායකය මගින් පනවන නීති ක්‍රියාවට නංවන ආයතනය වන්නේ,

i. විධායකයයි. ii. අධිකරණයයි.

iii. ව්‍යවස්ථාදායක සභාවයි. iv. මන්ත්‍රී මණ්ඩලයයි.

8) ජනාධිපති ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?

i. ව්‍යවස්ථාව තුළින් විධායකයින් පත්වීම.
ii. විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථා දායකයට හැකියාව ඇත.
iii. නාමික විධායකය හා සාහිත්‍ය විධායකය යන දෙකකින් සමන්විත වේ.
iv. විධායක බලය හසුරුවනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.

9) A -ව්‍යවස්ථාදායකය, B - විධායකය, C - අධිකරණය, D - ශ්‍රේෂ්ඨකරණය, E - පළාත් පාලන ආයතනය.

i. ADC ii. ABC iii. ABD iv. BCE

10) සෑම ආකාරයට ම අධිකරණ බලය එක් මධ්‍යම ආයතනයක් තුළ ඒකරාශී වී තිබේනම් එය ඒකීය රාජ්‍ය ක්‍රමයක් වේ. මෙම ප්‍රකාශනය,

i. මහාචාර්ය හර්මන් වේ නායිනර්. ii. ජනපති ඒබ්‍රහම් ලින්කන්
iii. කාල් මාක්ස් iv. මහාචාර්ය ගානර්.

11) බ්‍රිතාන්‍ය පාලන සමයේ ප්‍රථමවරට ස්ථාපනය කරන ලද මහනගර සභා වන්නේ,

i. කොළඹ, ගාල්ල. ii. කොළඹ, මහනුවර.
iii. කොළඹ, ගම්පහ. iv. කොළඹ, කළුතර.

12) තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණයක් වන්නේ,

i. ජනමතය නියෝජනයට ඇති ඉඩකඩ පුළුල් වීම.
ii. අන්නෝපතික පාලනයක් බිහිවීම.
iii. ආණ්ඩුව විවේචනයට ලක් කිරීමට හැකිවීම.
iv. එක්සත් ජාතීන් සඳහා වෙන වෙනම පක්ෂ නිර්මාණය කිරීම.

13) ඇමෙරිකා එක්සත් ජනපදයේ ආරම්භක ප්‍රාන්ත ආණ්ඩු ගණන කීයද?

i. 13 ii. 26 iii. 50 iv. 51

14) 1978 පළාත් සභා පිහිටු වීමේදී බලතල ලැයිස්තු හඳුන්වා දුන් අතර ඒවායෙන් සංවෘත ලැයිස්තුවට අයත් බලතල ගණන කීයද?

i. 37 ii. 17 iii. 36 iv. 30

15) මෙරට පළාත් ආණ්ඩුකාරවරයාගේ ධූර කාලය වන්නේ,

i. 5 යි. ii. 4යි. iii. 6යි. iv. කිසිවක් නොවේ.

16) 'කැප්ටන් ' යනු කුමන රාජ්‍යයක ප්‍රාන්ත ආණ්ඩුව හැඳින්වීම සඳහා භාවිතා වන නමද?

i. ඇමරිකාව ii. ඕස්ට්‍රේලියාව
iii. ඉන්දියා. iv. ස්විසලන්තය.

17) මධ්‍යම ආණ්ඩුව සතු බලතල පමණක් ව්‍යවස්ථයට ඇතුළත් කර ඉතිරි බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට ලබා දී ඇත්තේ කුමන රාජ්‍යක් ද?

i. ඉන්දියාව
ii. ඇමෙරිකා එක්සත් ජනපදය.
iii. ස්විසලන්තය
iv. රුසියාව.

18) අනුරාධපුර යුගයේ බලය විමධ්‍යක කරමින් පණ්ඩුකාභය රජු ගම් පාලනය සඳහා පත් කළ නිළධාරියා වන්නේ,

i. මහලේ
ii. මනමන
iii. ගාමණී
iv. බඩගරික

19) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ,

i. ජනාධිපති ආණ්ඩු ක්‍රමයයි.
ii. සමාජවාදී පාලන ක්‍රමයයි.
iii. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයයි.
iv. ඒකාධිපති ආණ්ඩු ක්‍රමයයි.

- අංක 20 සිට 30 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ ලකුණු කරන්න.

20) Democracy යන වචනය ලතින් භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට එක් වූ වචනයකි. (.............)

21) ක්‍රි.පූ. 6 සියවසේ ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ සහිත රාජ්‍ය පැවතුණි. (.............)

22) යුරෝපයේ වැඩවසම් ක්‍රමය ක්‍රි.ව. 5 වන සියවසේ සිට 15 වන සියවස දක්වා පැවතුණි. (.............)

23) නියමිත කාලසීමාව තුළ මැතිවරණ පැවැත්වීම නිදහස් සාධාරණ මැතිවරණ ලක්ෂණයක් නොවේ. (.............)

24) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය සම්මත කරගනු ලැබුවේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසිනි. (.............)

25) අධිකරණ කටයුතු මෙහෙයවීම ව්‍යවස්ථාදායකයේ ප්‍රධාන වගකීමකි. (.............)

26) ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ පරිපාලන නිළධාරියා වන්නේ අමාත්‍යාංශ ලේකම්ය. (.............)

27) ඒකීය ආණ්ඩු ක්‍රමයක් සහිත රටක් ලෙස ප්‍රංශය නම් කළ හැකිය. (.............)

28) සංස්කෘතියට ආගම හා ආචාර ධර්ම ඇතුළත් නොවේ. (.............)

29) ලොව ප්‍රධාන ආගම් හතරම අදහන පිරිස් ලංකාවේ වෙසෙති. (.............)

30) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් එක් ජාතියක්, එක් රටක් යන හැඟීම වර්ධනය වේ. (............)

31) පහත සඳහන් කරුණු අතරින් ඡන්ද දායකයකු සතු අයිතිවාසිකමක් නොවන්නේ,

i. ඡන්දය භාවිතා කිරීම.
ii. මැතිවරණ ප්‍රචාරක රැස්වීම් ඇමතීම.
iii. මැතිවරණ ප්‍රචාරක රැස්වීම්වලට සහභාගී වීම.
iv. නියමිත කාලය තුළ මැතිවරණය පැවැත්වීම.

32) ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය වශයෙන් හැඳින්වෙන්නේ,

i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.
ii. නීති සංග්‍රහයයි.
iii. අපරාධ නීතියයි.
iv. මානව හිමිකම් ජනතාව.

33) පාලකයන් ප්‍රජාතන්ත්‍රවාදී මාවතට යොමු කිරීමේ දී වැදගත් කාර්‍යභාරයක් කළ හැකි වන්නේ,

i. රාජ්‍ය සේවකයන්ට. ii. අමාත්‍යාංශ ලේකම්වරුන්ට.

iii. නිදහස් ජන මාධ්‍යන්ට iv. මානව හිමිකම් පනතට.

34) ඍජු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ පැහැදිලිව දක්නට ලැබෙන්නේ පහත කවර ක්‍රියාවලිය තුළ ද?

i. පාර්ලිමේන්තු මැතිවරණයක දී. ii. ජනමත විචාරණයක දී

iii. පළාත් සභා මැතිවරණයක දී. iv. පළාත් පාලන මැතිවරණයක දී.

35) යුරෝපයේ පුද්ගල නිදහස ඇගයීමට ලක් වූයේ,

i. ලිබරල් ආදී අදහස් නිසා. ii. වැඩ සමළු සමාජ ක්‍රමය නිසා.

iii. සමාජවාදී අදහස් නිසා iv. ධනේෂ්වර චින්තනය නිසාය.

36) පරමාධිපත්‍ය බලය යනු,

i. පාර්ලිමේන්තු බලයයි.

ii. රජිනට හිමි බලයයි.

iii. රාජ්‍යක් පාලන කටයුතු සඳහා ජනතාවට ඇති හැකියාවයි.

iv. අගමැතිවරයාට හෝ ජනාධිපතිට හිමි බලයයි.

37) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ශිෂ්‍යකු සතු අයිතිවාසිකමක් වන්නේ,

i. සාමකාමීව ජීවත් වීමට ඇත අයිතිය.

ii. අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය.

iii. ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය.

iv. වංචා කිරීම හා ............ ලබා ගැනීමේ අයිතිය.

38) ජාතික රාජ්‍ය සංකල්පය ශක්තිමත් කිරීමට දායක වූ දේශපාලන චින්තකයන්ගේ නම් ඇතුළත් පිලිතුර වන්නේ,

i. මාටින් ලූතර් කිං, මැකියා වෙල්ලි, ජීන් බොඩදන්.

ii. මැකියා වෙල්ලි, ජීන් බෝඩදන්, තෝමස් හොබ්ස්.

iii. මැකියා වෙල්ලි, රූසල්, ජීන් බොඩාන්.

iv. තෝමස් නොබ්ස්, මැකියා වෙල්ලි, ලෙනින්.

39) පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරන ආයතනය වන්නේ,

i. ඇමති මණ්ඩලයයි. ii. රාජ්‍ය නිළධාරින් ය.

iii. අමාත්‍යාංශ ලේකම්වරුන් ය. iv. මහ සභාවයි.

40) ආගම් අනුව ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 2012 වර්ෂයේ 9.7% ප්‍රතිශතයක් දැක්වූයේ කුමන ආගමිකයින් ද?

i. බෞද්ධ ii. ඉස්ලාම් iii. හින්දු iv. ක්‍රිස්තියානි.

| |
|---|
| **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| **දෙවන වාර පරීක්ෂණය - 2018** |

| | | |
|---|---|---|
| **පුරවැසි අධ්‍යාපනය** | **10 ශ්‍රේණිය** | **කාලය පැය දෙකකි** |

**නම: ...............................................................**

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1)

i. අතීතයේ සිට ලෝකයේ විවිධ රාජ්‍යයන් පාලනය සඳහා භාවිතා කළ ක්‍රම දෙකක් නම් කරන්න.

ii. උත්කෘෂ්ට විප්ලවය ලෙස හඳුන්වන්නේ කුමන විප්ලවයද?

iii. ලොව ඒකීය ආණ්ඩුක්‍රම පවතින රාජ්‍යයන් දෙකක් නම් කරන්න.

iv. බහු පක්ෂ ක්‍රමය සහිත ආසියාතික රටවල් දෙකක් නම් කරන්න.

v. බලය බෙදා ඇති ආකාරය අනුව රාජ්‍යයන් වර්ග දෙකක් නම් කරන්න.

vi. ආණ්ඩුවක් සතු ප්‍රධාන අවයව (Organs) දෙකක් නම් කරන්න.

vii. පුරවැසියෙකු සතු යුතුකම් වර්ග දෙකක් නම් කරන්න.

viii. සන්ධීය රාජ්‍යයක ලක්ෂණ දෙකක් නම් කරන්න.

ix. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන දෙකක් නම් කරන්න.

x. බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න.

2)

i. ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ස්වරූප දෙක සඳහන් කරන්න. (ල. 02)

ii. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කල දෙදෙනෙකු නම් කරන්න. (ල. 03)

iii. සමාජ හා ජීවන ක්‍රමයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් වේ. කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ල. 05)

3)

i. ඡන්ද කොට්ඨාසය අනුව නියෝජිතයන් තෝරා ගැනීම නිසා වන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ල. 02)

ii. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් දක්වන්න. (ල. 03)

iii. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් මාධ්‍ය මඟින් ඉටු කළ යුතු කාර්යන් දෙකක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

4)

i. ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න.

ii. සන්ධීය රාජ්‍යයක ලක්ෂණ තුනක් නම් කරන්න.

iii. ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යුහය පිළිබඳ කරුණු පහක් දක්වන්න. (ල. 05)

5)

i. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අටවන උපලේඛන අනුව ශ්‍රී ලංකාවේ පළාත් ගණන කොපමණද? (ල. 02)

ii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යාපාරයේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ලැයිස්තු තුනක් යටතේ බලතල දක්වා ඇත. අදාළ ලැයිස්තු තුන නම් කරන්න. (ල. 03)

iii. පළාත් සභාවක බලතල හා කාර්යයන් දෙකක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ල. 05)

6)

i. ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් නම් කරන්න. (ල. 02)

ii. බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් සඳහන් කරන්න. (ල. 03)

iii. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් අත්පත් කර ගත හැකි යහපත් ප්‍රතිඵල දෙකක් දක්වා ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

7)

i. සමාජයක දැකගත හැකි සංස්කෘතික ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල. 02)

ii. ශ්‍රී ලංකාවේ ජීවත්වන වැඩි ප්‍රතිශතයක් සහිත ජාතීන් තුනක් නම් කරන්න. (ල. 03)

යහපාලන ගුණාංග පහක් සඳහන් කරන්න. (ල. 02)